- ළමයින් විශේෂයෙන් ම අපරාධ වලට හා උල්ලංඝනයන්ට පහසුවෙන් ගොදුරු විය හැකි නිසා විශේෂ රැකවරණයක් මෙන්ම ඒවායින් නැවත වතාවක් වින්දිතයින් බවට පත්වීම වළක්වා ගැනීමට පසු සැලකිල්ල අවශ්‍යයි.
- නෛතික නියෝජනය සහ වෙනත් සේවාවන් සඳහා ළමයින්ට නීතියෙන් හිමිකම් තිබිය යුතුයි.
- ළමයින්ට අදහස් ප්‍රකාශ කිරීමට සහ තමන්ට ඇහුම්කන් දෙනු ලැබීමට අයිතියක් තිබේ.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) දක්වා ඇති ආකාරයට, "ළමා අයිතිවාසිකම් පදනම් වී ඇත්තේ දරුවකුගේ පැවැත්ම, වර්ධනය, සහභාගීත්වය සහ ඔවුන්ගේ හැකියාවන් සපුරාලීම සඳහා අවශ්‍ය දෑ මත ය".

වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආගම කුමක් වුවත් ඒවා සෑම දරුවෙකුට ම එකසේ අදාළ වේ.[4] ළමයාගේ අයිතිවාසිකම් විශේෂ ආකාරයකින් ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, 1989 දී එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) සම්මත කරන ලදී.

**ඔබ දන්නවා ද ?**

- ශ්‍රී ලංකාව 1990 ජනවාරි 26 වන දින **ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට** අත්සන් තබා 1991 ජූලි 12 වන දින එය අපරානුමත කළේ ය. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගැනීමත් සමඟ ශ්‍රී ලංකා රජය විසින් 1992 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය එළි දැක්විය.
(මූලාශ්‍රයඃ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය)

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978) මගින් කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ ආබාධිත පුද්ගලයින්ගේ අභිවෘද්ධිය සඳහා විශේෂ විධිවිධාන සලසා ඇත.

**(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (4) ව්‍යවස්ථාව)**



ටිකක් ඉන්න!

කාට හරි කියන්න පුළුවන් ද 'ළමයෙක් කියන්නේ කාට ද' කියලා ?

ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, ළමයා යනු **"වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු"** ලෙස අර්ථනිරූපණය කරනවා.

**ඔබට ළමා අයිතිවාසිකම් සම්මුතියේ මාර්ගෝපදේශක මූලධර්ම ගැන දැනගන්න අවශ්‍ය ද?**

මම ඒවා පැහැදිලි කරන්නම්.

---

4 https://www.unicef.org.nz/child-rights

* 4 වන පරිච්ඡේදය බලන්න.

## 1.2 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ මාර්ගෝපදේශක මූලධර්ම [5]

➢ **වෙනස්කොට නොසැලකිය යුතුය යන මූලධර්මය (2 වන ව්‍යවස්ථාව)**

*"සම්මුතිය සියලුම දරුවන්ට, ඔවුන්ගේ ජාතිය, ආගම හෝ හැකියාවන් කුමක් වුවත්; ඔවුන් සිතන්නේ හෝ කියන්නේ කුමක් වුවත්, ඔවුන් කුමන ආකාරයේ පවුලකින් පැමිණියත් එකසේ අදාළ වේ. ළමයින් ජීවත් වන ස්ථානය කුමක් ද යන්න, ඔවුන් කතා කරන භාෂාව කුමක් ද යන්න, ඔවුන්ගේ දෙමව්පියන් කරන්නේ කුමක් ද යන්න, ඔවුන් පිරිමි ළමයින් ද ගැහැණු ළමයින් ද යන්න, ඔවුන්ගේ සංස්කෘතිය කුමක් ද යන්න, ඔවුන්ට ආබාධ තත්ත්වයක් තිබේ ද යන්න හෝ ඔවුන් ධනවත් හෝ දුප්පත් ද යනා දී කිසිවක් ගැටළුවක් නොවේ. කිසිම දරුවෙකුට කිසිදු පදනමක් මත අසාධාරණ ලෙස සැලකිය යුතු නැත."*

මෙම මූලධර්මය කිසිදු ආකාරයක හෝ වෙනස්කම් කිරීමකින් තොරව සියලු ම දරුවන්ට සමාන අයිතිවාසිකම් සඳහා හිමිකම් ඇති බව සහතික කරයි. තනි ළමයින්, ළමුන් කණ්ඩායම් සහ පොදුවේ ළමයින් සඳහා වන සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් කිරීම් තුරන් කිරීම කෙරෙහි ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අවධානය යොමු කරයි. කෙසේ වෙතත්, විශේෂ සැලකිල්ලක් හා රැකවරණයක් අවශ්‍ය දරුවෙකු සඳහා, නිදසුනක් ලෙස ආබාධ සහිත දරුවෙකුට විශේෂ පහසුකම් සැපයීම, වෙනස් කොට සැලකීමක් ලෙස නොසැලකේ. එසේම, දුප්පත් දරුවෙකු සඳහා මූල්‍යාධාර හෝ ශිෂ්‍යත්ව ලබා දීම වෙනස් කොට සැලකීමක් නොවේ.

| | |
|---|---|
| **උදාහරණය :** | ඔහුගේ හෝ ඇයගේ ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය හෝ පවුලේ ආර්ථික තත්ත්වය හේතුවෙන් දරුවෙක් පාසලකට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප කිරීම වෙනස් කොට සැලකීමක් වේ. |

➢ **දරුවාගේ උපරිම යහපත (3 වන ව්‍යවස්ථාව)**

*"දරුවන්ගේ උපරිම යහපත යන්න, ඔවුන්ට බලපෑ හැකි තීරණ ගැනීමේ දී මූලික අවධානය හිමි වන කරුණ විය යුතු ය. සියලු ම වැඩිහිටියන් දරුවන්ට වඩාත් සුදුසු දේ කළ යුතුය. වැඩිහිටියන් තීරණ ගන්නා විට, ඔවුන්ගේ තීරණ දරුවන්ට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව සිතා බැලිය යුතු ය. මෙය විශේෂයෙන් ම අයවැය, ප්‍රතිපත්ති සහ නීති සම්පාදකයින්ට අදාළ වේ."*

ළමුන් සම්බන්ධ සියලු ක්‍රියාමාර්ගවල දී මූලික සැලකීමක් ලෙස තනි ළමයකුගේ හෝ ළමයින් කණ්ඩායමකගේ උපරිම යහපත සැලකිල්ලට ගනී.

| | |
|---|---|
| **උදාහරණය :** | ළමුන්ගේ භාරකාරත්වය පිළිබඳව තීරණය කිරීමේ නඩු වලදී, අධිකරණය 'දරුවාගේ උපරිම යහපත' යන මූලධර්මය අනුගමනය කරනු ලැබේ. භාරකාරත්වය ප්‍රදානය කිරීමේදී, දරුවාගේ ශාරීරික හා මානසික යහපැවැත්ම සහ සතුට සහතික කළ හැකි දෙමව්පියන්ට අධිකරණය විසින් භාරකාරත්වය ලබා දෙනු ලැබේ. |

➢ **පැවැත්ම හා සංවර්ධනය (6 වන ව්‍යවස්ථාව)**

*"දරුවන්ට ජීවත් වීමට අයිතියක් ඇත. දරුවන්ගේ පැවැත්ම හා සෞඛ්‍ය සම්පන්න බව රජය විසින් සහතික කළ යුතුය."*

ඔවුන්ගේ පැවැත්ම සහ සංවර්ධනය (ඔවුන්ගේ පූර්ණ හැකියාවන් වර්ධනය කිරීම ලෙස පුළුල් ලෙස අර්ථ නිරූපණය කර තිබේ) හැකි උපරිම ආකාරයෙන් සහතික කිරීමේ වගකීමක් රජයට ඇත.

[5] https://europa.eu/capacity4dev/sites/default/files/learning/Child-rights/2.7.html

- **ළමයින්ට සහභාගී වීමට ඇති අයිතිය (12 වන ව්‍යවස්ථාව)**

  *"වැඩිහිටියන් ළමයින්ට බලපාන තීරණ ගන්නා විට, සිදුවිය යුතු යැයි තමන්ට සිතන දේ කීමට දරුවන්ට අයිතියක් ඇති අතර ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගත යුතු ය. දෙමාපියන් විසින් කළ යුත්තේ කුමක්දැයි පැවසීමට ළමයින්ට හැකි බවක් මින් අදහස් නොවේ."*

  මෙම ව්‍යවස්ථාව දරුවාගේ අදහස්වලට ගරු කිරීම පිළිබඳ මූලධර්මය තහවුරු කරයි.

  එපමණක් නොව, **13 වන ව්‍යවස්ථාව (අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස)** අවධාරණය කරනුයේ; *"ළමයින්ට තොරතුරු ලබා ගැනීමටත් හුවමාරු කරගැනීමටත් අයිතියක් ඇත. ප්‍රකාශන නිදහස යන්නට කතා කිරීම, චිත්‍ර ඇඳීම හෝ ලිවීම ඇතුළු තමන් රුචි යම් මාධ්‍යයකින් තොරතුරු හුවමාරු කරගැනීමේ අයිතිය ඇතුළත් වේ."* යන්න ය.

## 1.3 ළමා අයිතිවාසිකම්

**4 වන ව්‍යවස්ථාව (අයිතිවාසිකම් ආරක්ෂා කිරීම)**

ළමා අයිතිවාසිකම්වලට ගරු කරනු ලබන බවට, ආරක්ෂා කරනු ලබන බවට හා ඉටු කරනු ලබන බවට සහතික කිරීම සඳහා පවත්නා සියලු ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍යයන්ට වගකීමක් ඇත.

**6 වන ව්‍යවස්ථාව (පැවැත්ම හා සංවර්ධනය)**

දරුවන්ට ජීවත් වීමට අයිතියක් ඇත. දරුවන්ගේ පැවැත්ම හා සෞඛ්‍ය සම්පන්න බව රජය විසින් සහතික කළ යුතු ය.

**9 වන ව්‍යවස්ථාව (දෙමාපියන්ගෙන් වෙන් කිරීම)**

එය ඔවුන්ගේ උපරිම යහපතට හේතු නොවේ නම් හැර, ළමයින්ට ඔවුන්ගේ දෙමව්පියන් සමඟ ජීවත් වීමට අයිතියක් ඇත.

**11 වන ව්‍යවස්ථාව (පැහැරගෙන යාම)**

නීතිවිරෝධී ලෙස ළමයින් තම රටෙන් පිටතට ගෙන යාම වැළැක්වීමට රාජ්‍යයන් විසින් පියවර ගත යුතු ය. මෙම ව්‍යවස්ථාව විශේෂයෙන් ම මව්පිය පැහැරගැනීම් සම්බන්ධයෙන් සැලකිලිමත් වේ.

**16 වන ව්‍යවස්ථාව (පෞද්ගලිකත්වය රැකගැනීමට ඇති අයිතිය)**

ළමුන්ට පෞද්ගලිකත්වය සඳහා අයිතියක් ඇත. නීතිය විසින් ඔවුන්ගේ ජීවන රටාවට, ඔවුන්ගේ හොඳ නමට, ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන්ගේ නිවෙස්වලට එරෙහි ප්‍රහාරයන්ගෙන් ඔවුන්ව ආරක්ෂා කළ යුතුය.

**19 වන ව්‍යවස්ථාව (සියලු ම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් වලට එරෙහි ආරක්ෂාව)**

ශාරීරික හෝ මානසික හිංසා පීඩාවලින් හා නොසලකා හැරීම්වලින් ආරක්ෂා වීමට ළමුන්ට අයිතියක් ඇත.

**27 වන ව්‍යවස්ථාව (ප්‍රමාණවත් ජීවන මට්ටම)**

සිය ශාරීරික හා මානසික අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා ළමයින්ට අයිතියක් ඇත.

**28 වන ව්‍යවස්ථාව (අධ්‍යාපනය සඳහා ඇති අයිතිය)**

සියලු ම දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා අයිතියක් ඇත. මෙම අයිතිය සාක්ෂාත් කර ගැනීමට ධනවත් රටවල් විසින් දුප්පත් රටවලට උදව් කළ යුතු ය.

**29 වන ව්‍යවස්ථාව (අධ්‍යාපන ඉලක්ක)**

ළමා අධ්‍යාපනය සෑම දරුවෙකුගේ ම පෞරුෂත්වය, කුසලතා සහ හැකියාවන් උපරිම ලෙස වර්ධනය කළ යුතු ය.

**31 වන ව්‍යවස්ථාව (විනෝදාත්මක, ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු)**

ළමයින්ට විවේකීව සිටීමට සහ සෙල්ලම් කිරීමට මෙන්ම පුළුල් පරාසයක සංස්කෘතික, කලාත්මක හා වෙනත් විනෝදාත්මක ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමට අයිතියක් ඇත.

**32 වන ව්‍යවස්ථාව (ළමා ශ්‍රමය)**

රජය විසින් භයානක හෝ සිය සෞඛ්‍යයට හානි කළ හැකි හෝ අධ්‍යාපනයට බාධා පමුණුවන රැකියාවලින් ළමයින්ව ආරක්ෂා කළ යුතුය.

**34 වන ව්‍යවස්ථාව (ලිංගික සූරාකෑම)**

රජය විසින් සෑම ආකාරයක ම ලිංගික සූරාකෑම්වලින් සහ අපයෝජනයන්ගෙන් ළමයින් ආරක්ෂා කළ යුතු ය.

**35 වන ව්‍යවස්ථාව (අපහරණය, විකිණීම හා වෙළඳාම් කිරීම)**

ළමයින් පැහැරගෙන යාම, විකිණීම හෝ වෙළඳාම් කිරීම සිදු නොවන බවට සහතික කිරීම සඳහා රජය හැකි සෑම පියවරක්ම ගත යුතු ය. ළමුන් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා කාමුක දර්ශන පිළිබඳ වෛකල්පිත සංධානය මගින් සම්මුතියේ මෙම විධිවිධානය වැඩි දියුණු කරනු ලැබී ය.

**36 වන ව්‍යවස්ථාව (වෙනත් ආකාරයේ සූරාකෑම්)**

ළමයින්ගෙන් ප්‍රයෝජන ගන්නා හෝ ඔවුන්ගේ සුභසාධනයට හා සංවර්ධනයට හානි කළ හැකි ඕනෑම ක්‍රියාකාරකමකින් ළමයින් ආරක්ෂා කළ යුතු ය.

**37 වන ව්‍යවස්ථාව (රඳවා තබා ගැනීම හා දඬුවම් කිරීම)**

ළමයින්ට කෲර හෝ හානිකර ආකාරයකින් ද දඬුවම් කිරීමට කිසිවෙකුටත් අවසර නැත. නීතිය කඩ කරන්නා වූ ළමයින්ට කෲර ලෙස නොසැලකිය යුතු ය.

**39 වන ව්‍යවස්ථාව (ළමා වින්දිතයින් පුනරුත්ථාපනය කිරීම)**


නොසලකා හරින ලද, අපයෝජනයට ලක් වූ හෝ සූරාකෑමට ලක්වූ දරුවන්ට ශාරීරිකව හා මානසිකව යථා තත්ත්වයට පත්වීමට හා සමාජය සමඟ නැවත ඒකාබද්ධ වීමට විශේෂ උපකාර හිමි විය යුතු ය.

**40 වන ව්‍යවස්ථාව (බාල වයස්කාර යුක්තිය)**

නීතිය උල්ලංඝනය කළ බවට චෝදනා ලැබ සිටින ළමයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන යුක්තිය පසිඳලීමේ ක්‍රමයක් තුළ නීති ආධාරවලට සහ සාධාරණ සැලකීමට අයිතිය ඇත.

**42 වන ව්‍යවස්ථාව (අයිතිවාසිකම් පිළිබඳ දැනුම)**

රාජ්‍යයන් විසින් මෙම සම්මුතිය පිළිබඳව වැඩිහිටියන්ට හා ළමයින්ට දැන ගැනීමට සැලැස්විය යුතු ය.



## 1.4 සමාප්තිය

එහෙයින්, ළමා වෙළඳාම ළමයින්ට එරෙහි අපරාධයක් වන අතර එය ළමයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරයි. මෙම බරපතල ගැටළුව ශ්‍රී ලංකාවට ද බලපා ඇත.




**ඔබ දන්නවා ද?**

**එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC)** විසින් නිකුත් කරන ලද තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ 2016 ගෝලීය වාර්තාවෙන් හෙළි වී ඇත්තේ; "2014 දී ගෝලීය වශයෙන් මිනිස් වෙළඳාමට ගොදුරු වූවන්ගෙන් සියයට 28 ක් ළමයින් බව ය."

වාර්තා වන පරිදි, ලිංගික සූරාකෑම, බලහත්කාරයෙන් වැඩ ගැනීම, බලහත්කාරයෙන් විවාහ කරවීම, නීති විරෝධී ලෙස දරුකමට හදා ගැනීම හෝ සිඟමනෙහි යෙදවීම ඇතුළු විවිධ අරමුණු සඳහා ළමයින් වෙළඳාම් කරනු ලැබේ.

### පරිශීලක ලැයිස්තුව/වැඩිදුර කියවීම්

- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989)
- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)
- කාන්තා හා ගැහැණු දරු ආරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා නීති නාමාවලිය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, 2012
- Training Manual to Fight Trafficking In Children for Labour, Sexual and other Forms of Exploitation, Facilitators' Guide, ILO and UNICEF, 2009, Available at; https://www.unicef.org/protection/Facilitator_guide.pdf



ඉගෙනුම් මෙවලම්

අභ්‍යාසය

**ක්‍රමවේදය**[6]

1. **මුහුණට මුහුණ සිදු කරන දේශන - (පැය එකහමාරක්)**

   න්‍යායාත්මක කොටස් සහ අන්තර්ජාතික ගිවිසුම් නීතිය හා ක්‍රියාකාරකම් ආශ්‍රිත භාවිතයන් අතර සියුම් වෙනසක් පවතින බව සහතික කිරීම වැදගත් ය. මෙහිදී පළමුව මෙම ඒකකයේ අරමුණු විස්තර කළ යුතු ය. මෙහි එන හැඳින්වීමේ කොටස තුළින් ළමා වෙළඳාම යනු මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව දැඩිව අවධාරණය කරයි. එය අපරාධ වරදක් වන අතර නීතිය යටතේ දඬුවම් ලැබිය හැක්කකි.

2. **දෘශ්‍ය ආධාරක**

   පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම්/පෝස්ටර්/වීඩියෝ පට හෝ වෙනත් සුදුසු දෘශ්‍ය ආධාරක භාවිතා කළ හැකි ය.

[6] This suggested methodology is compiled with the Training Manual to Fight Trafficking In Children for Labour, Sexual and other Forms of Exploitation, Facilitators' Guide, ILO and UNICEF, 2009

**3. සාකච්ඡා මාදිලිය**

උපදෙස් ලබා දීම සඳහා අන්තර් ක්‍රියාකාරිත්ව ක්‍රමවේදයක් භාවිතා කළ යුතු ය. සංකල්ප හා මූලධර්ම පැහැදිලි කිරීම සඳහා උදාහරණ ලබා දිය යුතු ය. පාරිභාෂික යෙදුම් සුදුසු උදාහරණ සමග සරල භාෂාවෙන් පැහැදිලි කළ යුතු ය. මෙම ඒකකය තුළ, පාරිභාෂික යෙදුම් අර්ථ දක්වා ඇති අතර පාඩමේ අන්තර්ගතය තුළ හෝ පාදාන්ත සටහන් තුළ ඒවා සරලව පැහැදිලි කර තිබේ.

**4. ප්‍රශ්න හා පිළිතුරු**

සහභාගිවන්නන්ට ප්‍රශ්න ඇසීමට සහ පැහැදිලි කිරීම් සිදු කර ගැනීමට අවස්ථාව ලබා දිය යුතු ය.

**5. විශේෂ උපදෙස්**

මෙම ඒකකයට අදාළ ඉගෙනුම් අරමුණු සහ අපේක්ෂිත ඉගෙනුම් පරමාර්ථ සහභාගිවන්නන්ට දැනුම් දිය යුතු ය. එසේම, සහභාගිවන්නන්ට දේශනයට පෙර මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් යන විෂයයන් පිළිබඳව ගැඹුරු දැනුමක් තිබිය යුතු යැයි අපේක්ෂා නොකෙරන බව සැලකිල්ලට ගත යුතු ය. පුහුණුකරු විසින් අධ්‍යාපනික පසුබිම සහ කණ්ඩායම් සාමාජිකයින්ගේ අවබෝධය කෙරෙහි ඔහුගේ/ ඇයගේ අවධානය යොමු කළ යුතු අතර පසුව වඩාත් සුදුසු ක්‍රමවේදයන් භාවිතා කළ හැකි ය.

## ඇගයීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම
## පළමු ඒකකය අවසානයේ දී

---

**1. සූදානම් වීම**

පුහුණු අත්පොතෙහි තාර්කික පදනම අවබෝධ කර ගැනීම පිණිස, සහභාගිවන්නන්ට තමන් නිරත වන කාර්යයන් සහ ඔවුන්ගේ පසුබිම 'විස්තර කරන ලෙස' ඉල්ලා සිටීමෙන් ආරම්භ කිරීම වඩාත් සුදුසු වනු ඇත. මෙහිදී විශේෂයෙන් ම සහභාගිවන්නන් ළමා වෙළඳාම ආශ්‍රිත ක්ෂේත්‍රයෙහි සේවය කර තිබේද නැතහොත් දැනටත් කටයුතු කරන්නේද යන්න දැන ගැනීම වැදගත් වේ.

(කාලය - මිනිත්තු 10)

**2. ක්‍රමවේදය**

සහභාගිවන්නන් 05 හෝ ඊට අඩු කණ්ඩායම්වලට බෙදන්න. "ළමා වෙළඳාම ළමා අයිතිවාසිකම් දැඩි ලෙස උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය හැක්කේ ඇයි?" යන මාතෘකාවට අදාළව කෙටි රචනයක් ලියන ලෙස කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

(කාලය - මිනිත්තු 10)

**3. ඇගයීම**

කණ්ඩායම්වලට ඔවුන්ගේ සොයා ගැනීම් සහ අදහස් පන්තියට ඉදිරිපත් කළ හැකි ය. පුහුණුකරුට සහ පන්තියේ අනෙකුත් සහභාගිවන්නන්ට එකී ඉදිරිපත් කිරීම් පිළිබඳව අදහස් දැක්විය හැකි ය.

(කාලය - මිනිත්තු 10)

**4. ක්‍රියාකාරකමේ අරමුණ (සහභාගිවන්නන් සඳහා)**

මෙම අභ්‍යාසය, සහභාගිවන්නන්ට ළමා වෙළඳාම යන ගැටලුවේ බරපතලකම අවබෝධ කර ගැනීමටත් එය ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස සම්බන්ධ කිරීමටත් ළමා වෙළඳාම තුරන් කිරීම පිණිස වන නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සහ රජයේ යුතුකම අවබෝධ කර ගැනීමටත් උපකාරී වේ.

**5. ක්‍රියාකාරකමේ අරමුණ (පුහුණුකරු සඳහා)**

පුද්ගල අවශ්‍යතා මත පදනම්ව පුහුණුව වෙනස් කිරීම සඳහා කණ්ඩායමෙහි අවබෝධතා මට්ටම සහ අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද හඳුනා ගැනීමට එය පුහුණුකරුට උපකාරී වේ.

**6. අවධානය යොමු කළ යුතු කරුණු**

සහභාගිවන්නන්ට, අදාළ තොරතුරු හෝ තමන්ගේ සටහන් කියවීමට ඉඩ දිය යුතු අතර ක්‍රියාකාරකම අතරතුර ප්‍රශ්න ඇසීමට ඉඩ දිය යුතු ය.

## දෙවන මොඩියුලය

| ළමා වෙළඳාම හා එහි මූල හේතු හඳුනාගැනීම | | |
|---|---|---|
| | **දේශන පැය ගණන** | 4 |
| | **ඇගයීම් ක්‍රමවේදය** | පන්ති කාමර සාකච්ඡා |
| | **අධ්‍යයන අරමුණු** | මෙම ඒකකය අවසානයේ දී සහභාගීවන්නන්ට :<br>➢ තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීම, මර්දනය කිරීම හා දඬුවම් කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ සංධානය යටතේ අර්ථ දක්වා ඇති තැනැත්තන් වෙළඳාම් කිරීම යන වරදෙහි මූලිකාංග අවබෝධ කරගැනීමට;<br>➢ තැනැත්තන් වෙළඳාම් කිරීමේ වරද සහ මිනිස් ජාවාරම සහ නීති විරෝධී සංක්‍රමණය වැනි අනෙකුත් වැරදි අතර සමානතා හා වෙනස්කම් හඳුනා ගැනීමට;<br>➢ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ළමා වෙළඳාමට අදාළ මූල හේතුවල සංකීර්ණතාවය හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීමට හැකි වනු ඇත. |

### a. ළමා වෙළඳාම හඳුනාගැනීම


මිනිස් වෙළඳාම සහ වෙනත් වැරදි අතර සමානතා හා වෙනස්කම් ගෙනහැර දැක්වීම

### 2.1 තැනැත්තන් වෙළඳාම

තැනැත්තන් වෙළඳාම පිළිබඳ වඩාත් සවිස්තරාත්මක අන්තර්ජාතික අර්ථ දැක්වීම තැනැත්තන් වෙළඳාම වැළැක්වීම, මර්දනය කිරීම සහ ඊට එරෙහිව දඬුවම් කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ සංධානය මගින් සපයනු ලැබේ. (පැලර්මෝ සංධානය)

| පැලර්මෝ සංධානයෙහි 3 (අ) ව්‍යවස්ථාව මගින් තැනැත්තන් වෙළඳාම පහත පරිදි අර්ථ දක්වා තිබේ: | |
|---|---|
| ක්‍රියාව | • බඳවාගැනීම, ප්‍රවාහනය, රැකවරණය දීම, හෝ පුද්ලයින් භාරගැනීම, |
| උපක්‍රමය | • තර්ජනය හෝ බලය යෙදවීම හෝ වෙනත් ආකාරයේ බලහත්කාරයන්<br>• පැහැරගෙන යාම<br>• වංචාව<br>• රැවටීම<br>• යම් පුද්ගලයෙකුගේ අසරණභාවය අයුතු ලෙස භාවිතා කිරීම; හෝ<br>• වෙනත් පුද්ගලයෙකු කෙරෙහි පාලනයක් ඇති පුද්ලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීම් හෝ ලාභ ප්‍රයෝජන ලබාදීම හෝ ලබා ගැනීම මගින්. |
| අරමුණ | • සූරා කෑමේ අරමුණ සඳහා |
| සූරාකෑම | සූරාකෑම යන්නට අවම වශයෙන්,<br>• ගණිකා වෘත්තියට යොදා සූරාකෑමට ලක් කිරීම හෝ වෙනත් ආකාරයේ ලිංගික සූරාකෑම,<br>• බලහත්කාර ශ්‍රමය හෝ සේවා ලබාගැනීම,<br>• වහල්භාවය හෝ වහල්භාවයට සමාන වෙනත් ක්‍රියාවන් සිදු කිරීම,<br>• දාසභාවයට පත් කිරීම හෝ<br>• අවයව ඉවත් කරගැනීම ආදිය ඇතුළත් වේ. |

- අපේක්ෂිත සූරාකෑම සඳහා අර්ථනිරූපණය තුළ දක්වා ඇති ඕනෑම ආකාරයක ***උපක්‍රමයක්*** භාවිතා කර ඇත්නම්, එහි දී තැනැත්තන් වෙළඳාම් කිරීමට යටත් වින්දිතයෙකුගේ **කැමැත්ත අදාළ නොවේ.**
- සූරා කෑමේ අරමුණ සඳහා, බඳවාගැනීම, ප්‍රවාහනය, ස්ථාන මාරු කිරීම, රැකවරණය දීම, හෝ ළමයෙකු භාරගැනීම නිර්වචනයේ දක්වා ඇති කිසිදු ***උපක්‍රමයක්*** ඊට සම්බන්ධ නොවුණ ද "තැනැත්තන් වෙළඳාම් කිරීමක්" වේ.
- **'ළමයා'** යන්නෙන් අදහස් කරන්නේ **වයස අවුරුදු 18 ට අඩු** ඕනෑම පුද්ගලයෙකි.





ඔබ දැන සිටියා ද?

දණ්ඩ නීති සංග්‍රහයේ 360 ඇ වගන්තිය අනුව තැනැත්තන් වෙළඳාම් කිරීම ශ්‍රී ලංකාවේ අපරාධමය වරදක් බවට පත් කර ඇත.





**අභ්‍යාසය**

3 දෙනා හෝ 4 දෙනා බැගින් වූ කුඩා කණ්ඩායම් වලට බෙදෙන්න.

පුද්ගල වෙළඳාම පිළිබඳව වචන 50 කට අඩු තාවකාලික නිර්වචනයක් සඳහා එකඟ වන්න.

එකී අර්ථනිරූපණයන් පිටු පෙරළිය හැකි පැඩයක් (flip chart) මතට ගනු ලබන අතර විවෘත කණ්ඩායම් සැසියක දී සාකච්ඡා කරනු ඇත[7]

## 2.2 මිනිස් ජාවාරම

බොහෝ විට මිනිස් ජාවාරම යන වරද, තැනැත්තන් වෙළඳාම් කිරීම යන වරද සමඟ පටලවා ගනු ලැබේ.

**"තැනැත්තන් වෙළඳාම් කිරීම මිනිස් ජාවාරම නොවේ!"**

| | |
|---|---|
| වර්ෂ 2000 අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට අතිරේක ගොඩබිමින්, මුහුදින් සහ ගුවන් මගින් සංක්‍රමණිකයින් ජාවාරම් කිරීමට එරෙහි සංධානයේ 3 (අ) වගන්තියට අනුව 'සංක්‍රමණිකයන් ජාවාරම් කිරීම' පහත පරිදි අර්ථ දැක්වේ: | |
| **ක්‍රියාව** | • සම්පාදනය කිරීම |
| **උපක්‍රමය** | • යම් රටක ජාතිකත්වය නොදරන හෝ ස්ථිර පදිංචිකරුවෙකු නොවන පුද්ගලයෙකු නීති විරෝධී ලෙස එකී රටට ඇතුළු වීම මගින් |
| **අරමුණ** | • මූල්‍යමය හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් සෘජුව හෝ වක්‍රව ලබා ගැනීම සඳහා |
| **නීතිවිරෝධී ඇතුළු වීම** | ප්‍රතිග්‍රාහක රාජ්‍යයට (තමන් ඇතුළුවන රටට) නීත්‍යානුකූලව ඇතුළුවීම සඳහා අවශ්‍ය කරන අවශ්‍යතාවයන්ට අනුකූල නොවී දේශසීමා තරණය කිරීම |
| **වංචනික ගමන් හෝ අනන්‍යතා ලේඛන** | ඕනෑම ගමන් හෝ අනන්‍යතා ලේඛනයක්,<br>අ. යම් රාජ්‍යයක් වෙනුවෙන් ගමන් හෝ අනන්‍යතා ලේඛනයක් සෑදීමට හෝ නිකුත් කිරීමට නීත්‍යානුකූලව බලයලත් පුද්ගලයෙකු හෝ ආයතනයක් හැර වෙනත් අයෙකු විසින් කිසියම් ආකාරයකින් ව්‍යාජ ලෙස සකස් කර හෝ වෙනස් කර තිබීම; හෝ<br><br>ආ. අනිසි ලෙස නිකුත් කර තිබීම හෝ වරදවා දැක්වීම, දූෂණය හෝ තර්ජනය හෝ වෙනත් නීති විරෝධී ආකාරයකින් ලබාගෙන තිබීම; හෝ<br><br>ඇ. නීත්‍යානුකූලව දරා සිටීමට බලය ලත් අයෙකු හැර වෙනත් පුද්ගලයෙකු විසින් භාවිතා කර තිබීම. |
| **යාත්‍රා** | යුධ නෞකාවක්, නාවික සහායක යාත්‍රාවක් හෝ යම් රාජ්‍යයක් සතු හෝ රාජ්‍යයක් විසින් ක්‍රියාත්මක කරන ලද සහ රජයේ වාණිජ නොවන සේවාවන් සඳහා පමණක් භාවිතා කරන ලද වෙනත් යාත්‍රාවක් හැර, ජලය මත ප්‍රවාහනය කිරීමේ මාධ්‍යයක් ලෙස භාවිතා කරන ලද හෝ භාවිතා කළ හැකි, විස්ථාපන නොවන යාත්‍රා සහ මුහුදු ගුවන් යානා ද ඇතුළුව ඕනෑම ආකාරයක ජල යාත්‍රා. |

[7] බලන්න, Counter-Trafficking training Modules (International Organisation for Migration Management, 7 Hill Street, Dublin) 82 < http://iomireland.ie/wp-content/uploads/2016/04/Train-the-Trainer-Manual-Original.pdf> (accessed 20th Dec 2018)




| **වෙළඳාම** | **ජාවාරම** |
|---|---|
| **වෙළඳාම යනු අවම වශයෙන් පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය, ස්ථාන මාරු කිරීම, රැකවරණය ලබා දීම හෝ පුද්ගලයින් භාර ගැනීම යනාදිය සම්බන්ධ වන ක්‍රියාවලියකි.** | ජාවාරම යන්නට සාමාන්‍යයෙන් පුද්ගලයන් ප්‍රවාහනය ඇතුළත් වේ. |
| | |
| **වෙළඳාම යන්නට අවම වශයෙන් තර්ජනය, බලහත්කාරය, රැවටීම, බලය අයුතු ලෙස භාවිතා කිරීම හෝ අනාරක්ෂිත බව, වංචාව හෝ පැහැරගෙන යාම යනා දී උපක්‍රම ඇතුළත් වේ.** | සාමාන්‍යයෙන් ජාවාරම යන්න සිදුවන්නේ ජාවාරම් කළ පුද්ගලයාගේ **කැමැත්ත** ඇතිව ය.   |
| | |
| **වෙළඳාම යන්න අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් සිදු විය හැකි ය.** | ජාවාරම යන්න දේශ සීමා ඉක්මවා යන්නකි. |
| | |
| **රැවටීම හෝ වෙනත් ආකාරයක උපක්‍රමයක් භාවිතා කර තිබේ නම් හෝ වෙළඳාමට ලක් වන්නා කුඩා දරුවෙකු වන විට, වෙළඳාමට ලක්වූ පුද්ගලයාගේ කැමැත්ත අදාළ නොවේ.** | බොහෝ අවස්ථාවල දී ජාවාරම සිදුවන්නේ පුද්ගලයාගේ කැමැත්ත ඇතිව ය. |
| | |
| **වෙළඳාම් කරන ලද පුද්ගලයෙකු හෝ දරුවෙකු වින්දිතයෙකු ලෙස සලකනු ලබන අතර ඒ හේතුවෙන් ඔවුන්ට රාජ්‍ය සහාය සඳහා හිමිකම් පවතී.** | ජාවාරම් කරන පුද්ගලයෙකු නීතිය උල්ලංඝනය කරන්නෙකු ලෙස සලකනු ලබන අතර නීතියෙන් දඬුවම් කළ හැකි ය. |

<table>
<tr><td></td><td></td></tr>
<tr><td>නිදසුන I<br>“A” යනු බලහත්කාරයෙන් ගල් අඟුරු ආකරයක සේවයේ යොදවන ලද 14 හැවිරිදි පිරිමි ළමයෙකි. ගල් අඟුරු ආකරයක වැඩ කිරීම යනු අවසර නොලැබෙන උපද්‍රවකාරී රැකියාවකි. එය සූරා කෑමක් වන අතර චලනය කරවීම (තැනකින් තවත් තැනකට රැගෙන යාම) සමඟ එකතු වූ විට වෙළඳාම් කිරීමක් වේ.<br><br>මෙම පිරිමි ළමයා රටින් පිටතට ගෙන ගොස් ඇත්තේ දෙමව්පියන්ගේ කැමැත්තට පටහැනිව නම්, රැවටීම හෝ බලහත්කාරය පෑම යන මූලිකාංගයක් තිබීමට ඉඩ ඇත. මේ බව පෙන්වා දිය හැකි නම් ළමයා වෙළඳාම් කර ඇති බවට හඳුනාගත හැකි ය. බඳවා ගත් තැනැත්තා ‘ළමයාගේ ශ්‍රමය සඳහා ගෙවීමක් කිරීම වෙනුවට’, “A” නම් ළමයාට රැකියාව පිළියෙල කර දීම වෙනුවෙන් ළමයාගේ පවුලෙන් ගාස්තුවක් අය කර ඇති නමුත් එයින් වෙනසක් සිදු නොවේ.[8]</td><td>නිදසුන II<br>ගනේෂ් යනු රට හැර යාමට අවශ්‍ය වූ ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයෙකි. කොළඹ සංචාරක ඒජන්සියක් විසින් ඔහුට මාසිකව රුපියල් 60,000ක වැටුපක් සහිතව සුපිරි වෙළඳසැල් අලෙවිකරුවෙකු ලෙස ඕස්ට්‍රේලියාවේ රැකියාවක් ලබා දෙන ලදී. අදාළ රටට ළඟා වූ පසුව ඒ හා සමාන ඉතිරි මුදලක් ගෙවිය යුතුව වීසා බලපත්‍රය සහ ටිකට් පත සඳහා අත්තිකාරම් මුදලක් ගෙවීමට ඔහුට සිදු විය. කිසිදු ලේඛනයක් සැපයුවේ නැත. ත්‍රිකුණාමලයේ සිටි නියෝජිතයෙකු පැවසුයේ රුපියල් 1,000,000 කට ගනේෂ්ව මුහුදු මාර්ගයෙන් ඕස්ට්‍රේලියාවට ප්‍රවාහනය කරන බවයි. ඔහුට රුපියල් 250,000 ක් අත්තිකාරම් වශයෙන් ගෙවීමට නියම කරන ලදි. තවත් 50 දෙනෙකු සමඟ ඔහුව කුඩා බෝට්ටුවක දමා ගැඹුරු මුහුදට ගෙන යන ලදී.</td></tr>
<tr><td colspan="2">කෙසේ වුවද, ජාවාරමක් ලෙස ඇරඹුණු යමක් වෙළඳාමක් බවට පත් වී අවසන් විය හැකි නිසා ජාවාරම් කිරීම හා වෙළඳාම් කිරීම අතර සියුම් සම්බන්ධතාවයක් පවතී.</td></tr>
</table>



**අභ්‍යාසය**

---

[8] Training Manual to Fight Trafficking in Children for Labour, Sexual and Other Forms of Exploitation – isn’t there a reference for this please?

සාරා යනු "A" නම් රටෙහි පදිංචි 20 හැවිරිදි කාන්තාවකි. ඇය අවිවාහක අතර තමන් විසින් එළවළු විකිණීමෙන් ජීවත් කරවන කුඩා දරුවන් දෙදෙනෙකු ඇයට සිටියි. දිනක් ඇය හමුවට පැමිණෙන  මිතුරියක් පවසනුයේ ඇයගේ වර්තමාන මාසික ඉපැයීම මෙන් දස ගුණයක් උපයා ගත හැකි "B" නම් රටේ ළමුන් බලාගන්නා රැකියාවක් ඇයට සොයා දිය හැකි බවයි. "B" නම් රටේ සාරා සිය නව රැකියාව ආරම්භ කළ වහාම වැය වූ වියදම් ආපසු ගෙවීමට එකඟ වන්නේ නම්, ඇගේ සියලු සංචාරක කටයුතු සිදු කර ඇගේ ගමන සඳහා මුදල් ගෙවීමට ද මිතුරිය පොරොන්දු වෙයි. මෙම අමතර ආදායම තම පවුලට ප්‍රයෝජනවත් වනු ඇතැයි තීරණය කළ සාරා, සිය දරුවන්ව තම මවගේ රැකවරණයේ තබා ඇයගේ මිතුරියගේ සමාගමේ බස් රථයකින් ගමන ආරම්භ කරයි. සාරාට විදේශ ගමන් බලපත්‍රයක් නැති නමුත් ඇගේ මිතුරිය සහතික වනුයේ තමන්ට දේශ සීමාවේ මිතුරන් සිටින බැවින් එවැන්නක් අවශ්‍ය නොවන බවයි.

එක් දිනක් සංචාරය කිරීමෙන් පසුව, මිතුරිය සාරාව බෝට්ටු කපිතාන්වරයෙකුගේ රැකවරණයේ තබා පිටත්ව යන්නේ ඔහු විසින් ඇයගේ ගමනාන්තය වන "B" නම් රටට ගෙන යනු ඇතැයි පවසමිනි. තම මිතුරිය විසින් සිය ප්‍රවාහනය සඳහා ගෙවිය යුතු යැයි සාරා අපේක්ෂා කළ බැවින්, එම මිනිසා තම මිතුරියට දිගු බිල් රෝලක් දෙනු දැකීමෙන් සාරා පුදුමයට පත් විය. එය සිය මිතුරියගේ පැත්තෙන් සිදු කෙරෙන තමාට සම්බන්ධයක් නැති ව්‍යාපාරික ගනුදෙනුවක් යැයි උපකල්පනය කරමින් සාරා එකී ගනුදෙනුව පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් නොඅසයි.

බෝට්ටුවේ කපිතාන්වරයා මිත්‍රශීලී අයෙකු වුව ද ඔහු සාරාගෙන් ඉල්ලා සිටින්නේ, රටට ඇතුළු වීමේ දී ප්‍රශ්නයක් ඇති නොවනු පිණිස ප්‍රවාහනයේ දී බෝට්ටුවේ වැසුණු කුටියේ තට්ටුව යට සිටින ලෙසයි. එය අඳුරු, උණුසුම් හා ඉතා අපහසුදායක ස්ථානයක් වූ නමුත්, තමන්ට විදේශ ගමන් බලපත්‍රයක් නොමැති නිසාවෙන් හා විශ්වාසය තැබිය හැක්කේ ඔහුගේ උපදෙස් හා හොඳ හිත මත පමණක් වූ නිසාවෙන් සාරා ඊට එකඟ වෙයි. කෙසේවෙතත්, දවසක සම්පූර්ණ චාරිකාවකින් පසුව රාත්‍රියේ, ඔහු බෝට්ටුව හුදෙකලා කුඩා වරායක නතර කළ අතර කුටිය විවෘත කර ඇයව දූෂණය කරයි. ඉන්පසුව ඔහු සාරාට නැවත කුටියට ඇතුළු වන සේ බල කරමින් එහි ඇතුළු කර පිටුපසින් අගුලු දමන ලබයි. එය ඉතා දිගු ගමනක් වූ අතර සාරාගේ ගමන එක් නැව් තටාකයකින් අවසන් වෙයි.. එහිදී බෝට්ටු කපිතාන්වරයාට මුණගැසෙන්නේ ඔහුට විශාල මුදලක් ලබා දෙන මිනිසුන් සිව්දෙනෙකි. සාරාට පැවසුවේ දැන් ඇය "B" නම් රටේ සිටින බවයි. ගසක් යට පැය කිහිපයක් බලා සිටීමෙන් පසු වාහනයක් පැමිණෙන අතර වාහනයේ පිටුපසට නගින ලෙස සාරාට අණ කරනු ලැබේ. ඒ වන විටත් තවත් තරුණියන් එහි වාඩි කරවා සිටි අතර, ඔවුන් සියල්ලන්ට ම පහර දී ඇති බවට සලකුණු පැවතුණි. සාරා බියෙන් පසුවන අතර, ඇයට පොරොන්දු වූ රැකියාව ලැබෙනු ඇතැයි තවදුරටත් විශ්වාස නොකරයි. ඇය ප්‍රතික්ෂේප කරන විට එහි සිටි පිරිමින් ඇයට තුවක්කුවක් පෙන්වා තර්ජනය කරනු ලබයි.

සාරා සහ අනෙක් කාන්තාවන් නාගරික ප්‍රදේශයක පෞද්ගලික නිවසකට ගෙන යනු ලැබේ. සති කිහිපයක් පුරා, පිරිමින් සිව්දෙනා විසින් කාන්තාවන්ව ශාරීරිකව හා ලිංගික වශයෙන් අතවරයට ලක් කරන අතර ඔවුන්ට එකී පරිශ්‍රයෙන් පිටව යාමට අවසර නොලැබේ.  සාරාට කියා සිටියේ ඇය පළාගියහොත් එරට පොලිසිය විදේශ ගමන් බලපත්‍රයක් නොමැතිව "B" නම් රටෙහි රැඳී සිටීම සම්බන්ධයෙන් ඇයව බන්ධනාගාරයක කරනු ඇති බවත්, ඇය නැවත කිසි දිනෙක තම දරුවන් දැකගත නොහැකි වනු ඇති බවත් ය. ඇයට තව දුරටත් කියා සිටියේ, කෙදිනක හෝ පළායාමට උත්සාහ කළහොත් ඇගේ දරුවන් සිටින ස්ථානය සොයාගෙන ඔවුන්ට පීඩා කරන බවයි.

පසුව, අනෙක් පිරිමින් නිවස අසල නතර වීමට පටන් ගත් අතර, සාරාට ඔවුන් සමඟ ලිංගිකව හැසිරීමට බල කෙරෙයි. ඒ සඳහා ඇයව අල්ලා ගත් සිව්දෙනාට ගෙවනු ලැබේ. අවසානයේ දී, සාරාව ගණිකා නිවාසයකට විකුණනු ලබන අතර එහිදී ගණිකාවක් ලෙස දිගට ම වැඩ කිරීමට ඇයට බල කෙරෙයි. ඇගේ ඉපැයීම් ගණිකා නිවාසයේ හිමිකරු විසින් ගනු ලැබේ. එක් රාත්‍රියක පොලිස් විසින් ගණිකා නිවාසය වටලන ලදි. නිසි ලියකියවිලි නොමැතිව "B" නම් රටෙහි රැඳී සිටින බව සොයා ගැනීමත් සමඟ ම වහාම සාරාව එරටින් පිටුවහල් කරනු ලැබේ.[9]

[9] එහිම, 84.